**ශිර්ෂය 300 - ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 15 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 නොවැම්බර් 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය එලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලද

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.2 (ආ) | 2019 දෙසැම්බර් 31 දින වන විටත් එකතුව වර්ග අඩි 479,603 ක් වූ ගොඩනැඟිලි 34 ක් හා දිස්ත්‍රික්ක 7 ට පවතින ඉඩම් කැබලි 14 ක් තක්සේරු කර දෙපාර්තමේන්තුවේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබීම. | දෙපාර්තමේන්තුව සතු ගොඩනැඟිලි ඉඩම් වටිනාකම නිවැරදිව ගිණුම්ගත කල යුතු වීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතුව ආදායම් ශීර්ෂයක් නොමැති වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ලෙස රු.28,238,944 ක් දක්වා තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වී තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් පරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම් නොවන ලැබීම් රු.105,587,156 ක් වුවද රු.99,220,347 ක් ලෙස රු.6,366,809 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | ආදායම් නොවන ලැබීම් දෙපාර්තමේන්තු මාසික ගිණුම් සාරාංශයට අනුව රු.99,220,347 කි. ඒ අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස එම අගය දක්වා ඇත. | දෙපාර්තමේන්තු පොත්වලට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | එකතු කළ අගය මත බදු ලැබීම් රු.7,888,722 ක් වෙනත් ලැබීම් ලෙස ද එකතු කළ අගය මත බදු ගෙවීම් රු.2,763,505 ක් වෙනත් වියදම් ලෙසද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | එය සංශෝධනය කිරීමට නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් පරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුයි. |
| (ඈ) | දෙපාර්තමේන්තු පොත් අනුව පැවති රු.378,805 ක සහනාධාර සහ මාරු කිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සහනාධාර සහ මාරු කිරීම් යටතේ දක්වා නොතිබුණි. | මෙය මුදලින් සිදු වූ ගනුදෙනුවක් නොවන අතර මාරුපත්‍ර මඟින් කල ගනුදෙනුවක් බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා නොමැත. | -එම- |
| (ඉ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.3,999,919 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එය රු.4,642,575 ක් ලෙස රු.642,656 ක් වැඩියෙන් දක්වා තිබුණි. | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ගෙවීම් වටිනාකම සහ අත්තිකාරම් ගෙවීම් වටිනාකමෙහි එකතුව මුදල් පොතට අනුව රු.4,642,575 ක් මෙහි දක්වා ඇත. | -එම- |
| (ඊ) | දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පතු ලැබීම් රු.23,169,438 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එය රු.12,139,267 ක් ලෙස රු.11,030,171 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව මාසික ගිණුම් සාරාංශයට අනුව මුදලින් සිදු වූ තැන්පතු ලැබීම් වල වටිනාකම රු.12,139,267 ක් වන අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දක්වා ඇත. | දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පතු ලැබීම් ගිණුම්ගත කිරීමට ක්‍රියාකල යුතුයි. |
| (උ) | දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පතු ගෙවීම් රු.18,626,109 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි එය රු.8,555,491 ක් ලෙස රු.10,070,618 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තු මුදල් පොතට අනුව මුදලින් සිදු කල තැන්පතු ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.8,555,491 ක් ලෙස දක්වා ඇත. | දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පතු ගෙවීම් ගිණුම්ගත කිරීමට ක්‍රියාකල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කල මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් වල ශුද්ධ වෙනස් වීම ශුන්‍ය විය යුතු වුවද රු.7,167,552 ක බැර ශේෂයක් 2020 දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය ලෙස දක්වා තිබුණි. | වැරදීමකින් මුදල් වල ශුද්ධ වෙනස් වීම රු.7,167,552 ක හිඟයක් පෙන්නුම් කරන අතර,එය ශුන්‍ය ලෙස නිවැරදි විය යුතුයි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට වගබලා ගත යුතුයි. |

## 1.6.2 දේපළ පිරියත හා උපකරණ

-----------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොත් අනුව රු.88.747,500 ලෙස පෙන්නුම් කල ගොඩනැඟිලි සහ ඉදිකිරීම් මූල්‍ය නොවන වත්කම් ගිණුමෙහි (ACA- 6 ආකෘතිය) දක්වා නොතිබුණු අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි කුලී හා වැඩ අත්තිකාරම් සංචිත යටතේ මෙන්ම දේපල පිරියත උපකරණ යටතේ ද දක්වා නොතිබුණි. | රු.88,747,500 ක වැය ශීර්ෂ යටතේ වියදම් දරා ඇති බැවින් එය කුලී හා අත්තිකාරම් ගිණුමට ඇතුලත් කර නැත. එසේම මෙය දැනට කෙරීගෙන යන කටයුත්තක් හේතුවෙන් ACA – 6 හි ඇතුලත් කර නැත. ඉදිරියේදී එය නිවැරදි කරන බව දන්වා තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අනුව වූ මාර්ගෝපදේශ අංක 6 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට ක්‍රියාකල යුතුයි. |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩවල වටිනාකම පිළිවෙලින් රු.2,439,254 ක් හා රු.1,862,495 ක් ලෙස දක්වා තිබුණද ACA 6 ආකෘතියෙහි එය පිළිවෙලින් රු.3,725,967 ක් හා රු.575,782 ක් ලෙස දක්වා තිබුණි . | කේත අංක 6112201 හා 6112205 යටතේ දක්වා ඇති වත්කම් වල අගයයන් මාරු වී සටහන් වි ඇත. පෙර වසරේ මූල්‍ය ප්‍රකාශනයේ තිබූ ශේෂය ඉදිරියට ගෙන ඒම නිසා මෙලෙස සටහන් වී ඇති බැවින් එය ඉදිරියේදී නිවැරදි කරන බව දන්වා තිබුණි. | ගිණුම්වල නිවැරදි අගයන් දැක්වීමට වගබලා ගත යුතුයි. |

## 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පාඩු ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය පොත් පත් පවත්වාගෙන යාම සඳහා කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි පරිදි හානි පාඩු ලේඛණයක් පවත්වාගෙන යාමට කටයුතු කල යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 වියදම් කළමනාකරණය

--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුනරාවර්තන වැය විෂයන් 03 ක් හා මූලධන වැය විෂයයන් 06 ක් සඳහා එකතු වටිනාකම රු.521,500,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.219,559,724 ක් උපයෝජනය කර රු.301,940,276 ක ඉතිරියක් පැවතුණ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ත් සියයට 99 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | රටේ පැවති අයහපත් වසංගත තත්වය යටතේ රට සම්පූර්ණයෙන්ම වසා දැමීම නිසා දඹුල්ලේ ඉදි කරමින් පවතින උෂ්ණත්ව පාලන ගබඩා සංකීර්ණය සඳහා ආනයනය කිරීමට නියමිත වූ උපකරණ, ගොඩනැඟිලි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර ගෙන්වා ගැනීමට නොහැකි වීම නිසා දඹුල්ල ශීතාගාර ව්‍යාපෘතිය සඳහා වෙන් කල වැය ශීර්ෂ අංක 2001-11,2001-13, හා 2001-17 යටතේ රු.261,622,123 ක් ඉතිරි විය. එමෙන්ම, 300-1-1-2001 සඳහා වෙන්කල ප්‍රතිපාදන වලින් හම්බන්තොට, කැකිරාව, ඔරුගොඩවත්ත ව්‍යාපෘතිද සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විම නිසා එම වැය ශීර්ෂයේද ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | සලසාගෙන තිබෙන ප්‍රතිපාදන වලින් හැකිතාක් දුරට උපයෝජනය කර අදාල කාර්යය නිම කල යුතුය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් තැන්පත් ගිණුමට මාරු කරන ලද බැරකම් පිළිබඳ සාක්ෂි නොවුවද මූල්‍ය ප්‍රකාශයන්හි සටහන (V) යටතේ මු.රෙ.215(3) (ආ) සහ (ඇ) ප්‍රකාරව රු.396,333 ක් තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන යටතේ දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශයන්හි සටහන V යටතේ මු.රෙ 215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව රු.396,333 ක් තැන්පතු ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන යටතේ සටහන් වී ඇත්තේ වැරදීමකින් බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුයි. |

## 2.3 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | මුදල් රෙගුලාසි 106 හා 113 | 1,452,350<br>202,319,590 | වසර 05 ට අඩු හා වසර 10 ට වැඩි අලාභ අයකර ගැනීමට හෝ විධිමත් පරිදි පරීක්ෂණ පවත්වා එම වාර්තා මත කපා හැරීමට ක්‍රියාකර නොතිබුණි. | එය ඉදිරියේදී කපා හැරීමට හෝ අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අයකර ගත නොහැකි අලාභ සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කළ යුතුයි. |
| (ආ) | මුදල් රෙගුලාසි 571 | 68,779,134 | වසර 02 ඉක්ම වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.අ | මු.රෙ 571 අනුව කටයුතු කර ඉදිරියේදී විගණනයට වාර්තා කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කල යුතුයි. |
| (ඇ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ඡේදය | 664,922 | සමාලෝචිත වර්ෂය තුල ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්වලින් හෙළිදරව් නොකළ ගෙවිය යුතු වියදම් 2021 වර්ෂයේ ජනවාරි මස තුල පියවා තිබුණි. | අවසන් ගිණුම් සකස් කිරීමේදී ගෙවීම් සඳහා වවුචර්පත් ඉදිරිපත් කර නොතිබීම නිසා අවසන් ගිණුම් ප්‍රකාශයට එය ඇතුලත් කිරීමට නොහැකි වී තිබෙන අතරම, ඉදිරියේදී මෙවැනි වැරදි ඇති නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කල යුතුයි. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන VIII යටතේ ඉදිරිපත් කර ඇති බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවෙහි රාජ්‍ය බැංකු ගිණුමෙහි 2020 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශන අනුව ශේෂය රු.95,955,972 ලෙස දක්වා තිබුණ ද බැංකු ප්‍රකාශය අනුව එම ශේෂය රු.93,955,972 ක් වුයෙන් රු.2,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශයන්හි සටහන VIII යටතේ ගිණුම් අංක 7042667 හි ශේෂය ලෙස රු.95,955,972 ලෙස දක්වා ඇත්තේ වැරදීමකින් වන අතර එහි නිවැරදි ශේෂය රු.93,955,972 ක් බව දන්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුයි. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දින වන විට වැඩ තහනමට ලක් වූ නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු.365,547 ක් වූ අතර ඒ තුල නිලධාරීන් 06 දෙනෙකුගේ අවුරුදු 05 ක් ඉක්ම වූ රු.202,627 ක ණය ශේෂයක්ද පැවතුණි. සේවය අතහැර ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු.826,656 කත් වූ අතර ඒ තුල නිලධාරීන් 08 දෙනෙකුගේ වසර 05 ඉක්ම වූ රු.643,076 ක ණය ශේෂයක් ද පැවතුණි. | 2020 වසරේ වැඩ තහනමට ලක් වූ හා සේවය අතහැර ගිය නිලධාරින්ගේ ණය අයකර ගැනීම සම්බන්ධ කටයුතු සිදුකරමින් පවතී. වසර 10 ක් ඉක්මවා ඇති අනෙකුත් නිලධාරීන්ගේ ණය ශේෂයන් අය කරගැනීමට විශ්‍රාම වැටුප් හිමිකම් ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැති අතර ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු සොයා ගත නොහැකි වීම නිසාත් කිසිදු තොරතුරක් සොයා ගත නොහැකි වීම නිසාත් පොත් වලින් ලියා හැරීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 දෙසැම්බර් 31 දින විට වසර 05 ඉක්ම වූ මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.154,130 ක ණය ශේෂයකක්ද, විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.174,157 ක ණය ශේෂයක් පැවතුණි. | මියගිය නිලධාරියාගේ විශ්‍රාම වැටුප් හිමිකම් ලබාගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැත.ණය සඳහා ඇප වී ඇත්තේ රක්ෂණභාර අරමුදලයි. මේ පිළිබඳ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතද තොරතුරු ලබා දී ඇත. විශ්‍රාම ගිය එක් අයෙකුගේ ණය ශේෂය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ගෙන්වා ගැනීමට දන්වා ඇති අතර තවත් අයෙකුගේ ණය ශේෂය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. අනෙක් නිලධාරියාගේ නිතීමය කටයුතු අවසන් වී ඇති අතර ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුයි. |
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අතර පෙර වර්ෂ වල සිට පැවත එන රු.332,250 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස 2020 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂවල සිට පැවත එන මෙම වෙනස හඳුනාගැනීමට උත්සහ කරන අතර මෙතෙක් එහි ප්‍රතිඵල සොයාගත නොහැකි වී ඇත. | වෙනස හඳුනාගැනීමට කටයුතු කල යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව ''ආරක්ෂිතව අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සෑම නිවසකටම'' යන දැක්ම අනුව ක්‍රියාත්මක වන අතර ඒ යටතේ,<br>(අ) දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගිතා සංවිධානයේ (SAARC) කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙ.ටො.8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම. | ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වා ගැනීම සඳහා රු.මිලියන 200 ක් සහ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට ණය සහන ලබා දෙමින් වෙළඳ පොළ සහල් සුලභතාවය ඇති කිරීම සඳහා රු.මිලියන 300 ක්ද ලබා දෙන ලෙස | ආයතනයේ දැක්ම සහ ප්‍රධාන අරමුණු ඉටු කරගැනීමට අදාල කෘත්‍යයන් නොපමාව ක්‍රියාත්මක කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2008 අප්‍රේල් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙ.ටො.100,000 ක ආරක්ෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම.<br><br>ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනාගෙන තිබුණ ද 2020 වර්ෂය තුල දෙපාර්තමේන්තුව සතුව කිසිදු සහල් සංචිතයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | ඉල්ලමින් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020 වසරේදී අනුමැතිය ලැබුණි. ඒ අනුව, සහල් සංචිත පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන මූලික කටයුතු 2020 වර්ෂයේදී සිදු කර ඇත | |

**3.2 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දඹුල්ල උෂ්ණත්ව පාලන ගබඩාව ඉදි කිරීම සඳහා 2019 ජූනි 26 දින රු.524,244,587 ක් වටිනාකමකට මාස 06 ක් සඳහා ගිවිසුම් ගත වී තිබුණු අතර ගිවිසුමට අනුව 2019 දෙසැම්බර් 26 දින වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කල යුතුව තිබුණි. එසේ වුවද 2021 මාර්තු 31 දින වන විටත් එහි වැඩ අවසන්ව නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට රු.283,245,417 ක මුදලක් ඒ සඳහා වැයකර තිබුණි. | නිරීක්ෂණය හා එකඟව තිබුණි. | සැලසුම් කල පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි. |

**3.3 ප්‍රසම්පාදනයන්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අයවැය ඇස්තමේන්තුව අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා රුපියල් මිලියන 153 ක් හා දඹුල්ල උෂ්ණත්ව පාලන ගබඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 356 ක් ඇස්තමේන්තු කර තිබුණද රුපියල් මිලියන 167 ක් සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණි. | සංශෝධන ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | අයවැයට සමගාමීව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුයි. |
| (ආ) | 2020 වර්ෂය සඳහා කාර්ය මණ්ඩල පුහුණුව සඳහා රු.250,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද ඒ තුල ප්‍රසම්පාදන කාර්යයන් ඇතුලත් වී නොතිබුණි. එසේ වුවද දෙපාර්තමේන්තුව විසින් 2020 වර්ෂයට පිළියෙල කල ප්‍රසම්පාදන සැලැස්මෙහි කාර්යය මණ්ඩල පුහුණුව වෙනුවෙන් රු.390,000 ක ප්‍රසම්පාදනයන් ඇතුලත් කර තිබුණි. | සංශෝධන ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | අයවැයට සමගාමීව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට වගබලා ගත යුතුයි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**---------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු වත්කම් අවසන් වරට 2019 වර්ෂයේදී තක්සේරු කර තිබු අතර තවදුරටත් තක්සේරු කර නොමැති ඉඩම් සහ ගොඩනැඟිලි 2020 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව සතුව පැවතුණි. | තක්සේරු කර නොමැති වත්කම් ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරනු | තක්සේරු ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට ක්‍රියා කල යුතුයි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2009 වර්ෂයේ සිට 2014 ජූලි 31 දින දක්වා කෑගල්ල පරගම්මන ගබඩා සංකීර්ණ පුද්ගලික සමාගමක් පරිහරණය කර තිබුණි. 2014 ජූලි 31 දිනට මෙම සමාගමෙන් අයවිය යුතු හිඟ කුලිය රු.541,017 ක් වූ අතර එය අයකරගැනීම සඳහා 2016 ඔක්තෝම්බර් 25 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණද හිඟකුලී අයකර ගැනීමට නොහැකි වී තිබුණි. අංක 01,02,03 දරන ගබඩා රු.110,000 ක් වූ මාසික කුලී වටිනාකමට 2020 සැප්තැම්බර් 01සිට වසරක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත ලබාදීමට 2020 ජූලි 29 දින ගිවිසුම් ගත වී තිබුණු අතර, අගෝස්තු 24 දින රු.690,000 ක් වූ තැන්පතු මුදල් තැන්පත් කර තිබුණි. එසේ වුවද, 2020 ඔක්තෝම්බර් 13 දිනැති ලිපියෙන් මෙම ගබඩා දෙපාර්තමේන්තුව වෙත ආපසු ලබාදෙන ලෙසත් මූලික තැන්පතු මුදල් නැවත ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි. මේ සඳහා හේතු වූ කරුණු නිරීක්ෂණය නොවුණු අතර වර්තමානය වන විට මෙම ගබඩා දෙපාර්තමේන්තුව වෙත නැවත ලබාගෙන තිබුණි. | කෑගල්ල පරගම්මන ගබඩා වෙනුවෙන් විජිත සමූහ ව්‍යාපාරය වෙතින් අයවිය යුතුව පවතින රු541,017 ක මුදල අය කරගැනීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර කොළඹ දිසා අධිකරණ අංක 01226/19 යටතේ නඩු පවරා ඇත. එම නඩුව 2020/08/24 දින අවසන් වරට කැඳවා ඇති අතර එම නඩුව තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී.<br>වෙළඳ අමාත්‍යතුමාගේ උපදෙස් මත එම ගබඩාව දෙපාර්තමේන්තු භාරයේම තබා ගන්නා ලෙස උපදෙස් දෙමින් ආහාර කොමසාරිස් විසින් 2020.10.13 දිනැති ලිපිය යොමු කර ඇත. | අයවිය යුතු මුදල කඩිනමින් අයකර ගැනීමට ක්‍රියා කල යුතුයි. |
| (ආ) 2020/15 හා 2020 අප්‍රේල් 14 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල්හිමියන් වෙත කාරක ප්‍රාග්ධනය ලබාදීමේ වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලයෙන් අනුමත මුදල රු.මි.300 ක් වුවද 2020 දෙසැම්බර් 31 වන විට රු.මි.293 ක් පමණක් ලැබී තිබූ අතර එයින් ද සියයට 81 ක් ලැබී තිබුණේ 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් | | |

| | | |
|---|---|---|
| කාලසීමාවේදීය. ඒ වන විට 2020 යල කන්නයේ වී අස්වනු නෙලීම ද ආරම්භ වී තිබුණි.<br>මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| i. 2020 දෙසැම්බර් 31 වන විට පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන් වෙත රු.මි.292.7 ක් ලබා දී තිබුණ ද, ඉන් මිලියන 105.7 ක් ලබා දී තිබුණේ සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන දෙසැම්බර් 30 හා 31 දිනයන්හි දීය. රු.මි.87.2 ක මුදලක් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර්ගේ අනුමත සමුපකාර සමිති ලැයිස්තුවේ ඇතුළත් නොවූ සමුපකාර සමිති 04 ක් වෙත ලබා දී තිබුණි. එසේම සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද මුදලට වඩා උතුරු මැද හා වයඹ පළාත් වෙත රු.මි.91 ක් ලබා දී තිබුණි. | එම සමිති වෙත ණය ලබා දීම මෙම වැඩසටහන අධීක්ෂණය සඳහා පත් කරන ලද අධීක්ෂණ කමිටුව විසින් අනුමත කර තිබුණි.<br>2018/2019 වැඩ සටහන සඳහා ණය මුදල් ලබා දීම තීරණය කරනු ලැබුවේ සමිති මඟින් බැංකු සඳහා ගෙවීමට තිබෙන ණය වාරික වටිනාකම හා සාමාජික මෝල් වල සහල් නිෂ්පාදන ධාරිතාවය පදනම් කරගෙන බැවින් සමුපකාර කොමසාරිස් නිර්දේශ කර ණය වටිනාකම ඉක්මවා ණය ලබාදීමට සිදුවේ. එමෙන්ම 2018/2019 වර්ෂවල ලබා දුන් ණය ප්‍රමාණය අඩු කිරීම යුක්ති සහගත නොවන බැවින් එම ප්‍රමාණයම 2019/2020 වැඩසටහනේද ලබා දීමට තීරණය කර ඇත. | අනුමත සැලැස්මකට අනුව ප්‍රතිලාභීන් වෙත අදාල මුදල නියමිත කාලය තුල ලබාදීමට ක්‍රියාකල යුතුයි. |
| ii. උතුරු පළාතේ සමුපකාර සමිති 14 ක් සඳහා රු.මි.45 ක් අනුමත කර තිබූ අතර 2020 අගෝස්තු 19 දින ඉන් රු.මි.20 ක් උතුරු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත යවා තිබුණ ද ඉන් රු.මි.16 ක් වී මිලදී ගැනීමට යොදා නොගෙන 2020 ඔක්තෝම්බර් 12 හා 14 දිනයන්හි නැවත ආපසු හරවා එවා තිබුණි. ඉතිරි මිලියන 4 සමිති 03 ක් සඳහා ලබා දී තිබුණු අතර එක් සමිතියක් අනුමත ලැයිස්තුවේ නොතිබුණි. | එකඟ වෙමි.<br>පළාත් සමුපකාර කොමසාරිස් නිර්දේශ කර ඉදිරිපත් කරන සමිති සඳහා ණය පළාත් සමුපකාර කොමසාරිස් විසින් ලබාදෙන අතර එය අධීක්ෂණය කිරීම ද ඔහු සතුය. | ලබාදෙන මුදල් නියමිත පරිදි උපයෝජනය කරන්නේද යන්න අධීක්ෂණය කල යුතුයි. |
| iii. පළාත් සමුපකාර කොමසාරිස්වරුන් වෙත ලැබුණු මුදල රු.මිලියන 292.7 ක් වුවද, ඉන් සමුපකාර සමිති සඳහා 2021 ජනවාරි 12 දින වන විටත් ලබා දී තිබුණේ රු.මිලියන 276.7 ක් පමණි. එම මුදලින් වී මිලදී ගැනීම සඳහා මෝල් හිමියන්ට රු.144.1 ක් පමණක් ලබා දී තිබුණි. ඒ අනුව | එකඟ වෙමි. | ලැබෙන මුදල් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට ක්‍රියාකල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | සමුපකාර සමිති වලට ලැබුණු මුදලින් සියයට 52 ක් සමුපකාර සමිති තුල රඳවා ගෙන තිබුණි. | | |
| iv. | වයඹ පළාත් සමුපකාර සමිති 3 ක් සඳහා ලබාදුන් මිලියන 118 ක මුදලින් මෝල් හිමියන්ට ලබා දී තිබුනේ රු.මිලියන 34.9 ක් හෙවත් සියයට 29 ක් පමණි. ඉන් සී/ස පුත්තලම දි.ස.නි.ස සමිතියට ලබා දෙන ලද රු.මිලියන 70 ක මුදල 2021 ජනවාරි 12 වන විටත් කිසිදු මෝල් හිමියකුට ලබා නොදි උපයෝජනයකින් තොරව රඳවා ගෙන තිබුණි. | එකඟ වෙමි. | නියමිත කාලසීමාව තුල සියලුම මුදල් උපයෝජනය කිරීමට ක්‍රියා කල යුතුයි. |
| v. | සංදේශයේ යෝජනා සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදීමේදී ණය පහසුකම් ලබා ගෙන නොමැති හා බැංකු වෙත ණය වාරික ගෙවීම් පැහැර හැර නොමැති සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් වෙත පමණක් යෝජිත කාරක ප්‍රාග්ධන පහසුකම් ලබා දීමට අනුමත කර තිබුණි. එහෙත් 2019 වසරේ ණය ලබාදීමේ වැඩසටහන යටතේ රු.මිලියන 180.7 ක ණය මුදල් ලබා දී තිබු දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති 5 ක් සඳහා මෙම වැඩසටහන යටතේ රු.මිලියන 214 ක කාරක ප්‍රාග්ධන පහසුකම් ලබා දී තිබුණි. | ණය මුදල නිසි පරිදි ගෙවා අවසන් කළ බවට අදාළ දිස්ත්‍රික් ලේකම් වෙතින් තහවුරු වූ පසු මෙම සමුපකාර සමිති 05 සඳහා මුදල් නිදහස් කරන ලදී. | අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් නියමයන් අනුව කටයුතු කල යුතුයි. |
| vi. | සංදේශය සඳහා 2020 මැයි 07 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද, මෝල් හිමියන් වෙත මුදල් ලබාදීම සිදුකර තිබුණේ 2020 යල කන්නයේ වී අස්වැන්න නෙලීම අවසන් වීමෙන් පසුවය. | මෙමඟින් මුදල් ලබා දෙනුයේ වී මිල දී ගෙන නිෂ්පාදනය කිරීම සඳහාය. එබැවින් යල කන්නය තුල මිලදී ගත් වී සහල් බවට පත් කිරීම සඳහා යල කන්නයේ අස්වැන්න ලැබීමෙන් පසුව ද මෙම මුදල් පාවිච්චි කිරීමට හැකිවේ. | නියමිත කාලසීමාව තුල මුදල් ලබා දීමට ක්‍රියාකල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| vii. | සංදේශයේ (4) ඡේදයේ (2) අනුව ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ කමිටුවට මුදල් අමාත්‍යාංශයේ, වී අලෙවි මණ්ඩලය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනයේ නිලධාරියකු බැගින්ද ඇතුලත් විය යුතු බව දක්වා තිබුණද, 2020 ජූලි 29 දිනැති NITC/FD/පොදු-11 ලිපිය අනුව අධීක්ෂණ කමිටුව පත් කිරීමේදී එසේ සිදු කර නොතිබුණි. | එම ලිපිය වෙළඳ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද්දකි. | සංදේශයේ කොන්දේසි පරිදි කටයුතු කල යුතුයි. |
| viii. | 2020 අගෝස්තු 11 දිනැති අධීක්ෂණ කමිටු රැස්වීමේදී මසකට තුන් වතාවක් හෝ හතර වතාවක් රැස් වි වී මිලදී ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් සාකච්ඡා කලයුතු බව තීරණය කර තිබුණද, 2020 දෙසැම්බර් 17 FC/6.1/2/මු.පු/2020 දිනැති පිළිතුරු ලිපියට අනුව එදින වන විට කමිටුව රැස්වී තිබුණේ, තුන් වතාවක් පමණි. | 2020 වසර පුරා පැවති හදිසි කොවිඩ් 19 තත්වය මත අධීක්ෂණ කමිටුව රැස්වුයේ තුන් වතාවක් පමණි.<br>. | අධික්ෂණ කමිටු රැස්වීම් තිරණ අනුව කටයුතු කල යුතුයි |

**4. යහපාලනය**
-------------

**4.1 අභ්‍යන්තර විගණනය**
------------------------

| **විගණන නිරික්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) සහ 2 වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කලයුතු අතර අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති නම් පනත ක්‍රියාත්මක වන දින සිට වසර දෙකක් තුල පත් කිරීම සිදුකල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතුව අභ්‍යන්තර විගණන අංශයක් නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

**-------------------------------------**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන කළමනාකරණ කමිටු පත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | පනත ප්‍රකාරව ක්‍රියාකිරීමට වගබලා ගත යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 227 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 86 ක් වූයෙන් 141 ක පුරප්පාඩු පැවතිණි. | පුරප්පාඩු පිරවීම සම්බන්ධව රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීම් කර ඇත. විශ්‍රාම යාම, මියයාම මත හා පසුව නිලධාරියෙකු ලබාදීමේ පදනම මත ස්ථාන මාරුවීම් <br><br> හේතුවෙන් ද පුරප්පාඩු සිදුව ඇත. වාප්පු ක්ෂේත්‍ර නිලධාරී හා මුරකරු තනතුරු දැනට තනතුර දරන්නාට පෞද්ගලික වන සේ පවත්වාගෙන යනු ලබන අතර පුරප්පාඩු පිරවීමක් සිදු නොවේ. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුයි. |